දේවත්වය විශ්වාස කරන්නන් අතරින් විශ්වාසයෙන් වඩාත් පුර්ණවත් තැනැත්තා ඔවුන් අතර සදාචාරයෙන් වඩාත් යහපත් තැනැත්තාය. නුඹලා අතරින් වඩාත් ශේර්ෂ්ඨ තැනැත්තා නුඹලා අතර තම බිරියන් හට ශේර්ෂ්ඨ තැනැත්තාය

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව
අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. "දේවත්වය
විශ්වාස කරන්නන් අතරින් විශ්වාසයෙන් වඩාත් පුර්ණවත් තැනැත්තා ඔවුන් අතර සදාචාරයෙන් වඩාත් යහපත් තැනැත්තාය. නුඹලා අතරින් වඩාත් ශේර්ෂ්ඨ තැනැත්තා නුඹලා
අතර තම බිරියන් හට ශේර්ෂ්ඨ තැනැත්තාය." [حسن] [رواه أبو داود والترمذي وأحمد]

ජනයා අතරින් විශ්වාසයෙන් වඩාත් පුර්ණවත් තැනැත්තා තම ගුණ යහපත් බවින් දැහැමි තැනැත්තාය යැයි නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ දන්වා සිටියහ. ඒ සිනහමුසු මුහුණින්, යහප හැසිරීමෙන්, හොඳින් කථා කිරීමෙන් සහ හිංසනය වැළැක්වීමෙන් වේ. දේවත්වය විශ්වාස කරන්නන් අතරින් වඩාත් ශේර්ෂ්ඨතම තැනැත්තා නුඹලා අතර තම බිරියන්, දියණියන්, සහෝදර සහෝදරියන් හා හිතවතුන්ට ශේර්ෂ්ඨ තැනැත්තාය. ඊට හේතුව සැබැවින්ම මොවුන් යහපත් ගතිගුණවලින් ආශ්රය කිරීම සඳහා වඩාත් සුදුසුම තැනැත්තන් වන බැවිනි.

https://sunnah.global/hadeeth/si/show/5792